# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2072/18 – 2018 මැයි 22 වැනි අඟහරුවාදා – 2018.05.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුව සුළු කොට්ඨාසයේ, මොරගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ගම්/ගම්/2017/121 හා 2017.05.26 දිනැති පූගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0104 ක් පමණ වන ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – **කෝන්ගහවත්ත නොහොත් කමත්ගොඩැල්ලවත්ත හෝ ගොඩැල්ලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0104**

උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: පී. එම්. ශ්‍රියාලතා පෙරේරා හිමිකම් කියන කෝන්ගහවත්ත නොහොත් කමත්ගොඩැල්ලවත්ත හෝ ගොඩැල්ලවත්ත; දකුණට: එච්. පී. ඩබ්ලිව්. පෙරේරා මාවත; බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2016/එච්ජ්/331.
2018 අප්‍රේල් මස 06 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
අංක 1200/6, ''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 – 358


1A – G 27707 – 12 (2018/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*